# ENTREPRENEURSHIP
# (Part-I)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ව්‍යවසායකත්වය පිළිබඳ නිර්වචන

"අවස්ථාවක් උදාකර ගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන්නා ව්‍යවසායකයෙකි. අවස්ථා උදාකර ගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේ දී සම්බන්ධ වන සියලු කටයුතු සහ කාර්ය ව්‍යවසායකත්ව ක්‍රියවලියට ඇතුළත වේ."

**විලියම් ඩී. බයිග්‍රේව්**

"නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිත කිරීමෙන් හෝ පවත්නා අර්ථ ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි."

**ජෝෂප් ෂුම් පීටර්**

"ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යවසායකත්වයයි.

**ඔක්ස්පර්ඩ් ශබ්දකෝෂය "**

ClassWork.LK

අවිනිශ්චිතතාවලට මුහුණ දීම ව්‍යවසායකත්වයයි.

**රිචඩ් නැන්ටිනට්**

"නව ව්‍යාපාරයක් දියත් කොට සාර්ථක ව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි."

**අන්තර්ජාතික කම්කරු සංවිධානය**

## ඉහත නිර්වචන ඇසුරෙන් ව්‍යවසායකත්වය පිළිබඳ ව ගොඩනැගිය හැකි අර්ථකථනය

පරිසර අවස්ථා නිර්මාණශීලී ව උකහා ගනිමින්, අවදානමක් දරා නවෝත්පාදන බිහි කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි.

හෝ

මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර අවස්ථා මතු කරමින් අවදානම් කළමනාකරණය කරමින් කෙරෙන නව්‍යතා සම්පාදන ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි.

ClassWork.LK

# ව්‍යවසායකත්වයේ වැදගත්කම

- වේගයෙන් වෙනස් වන ලෝකයේ වෙනස්වීම්වලට ප්‍රතික්‍රියා දැක්විය හැකි, නව්‍යතා සෙවිය හැකි ව්‍යවසායකයින්ගේ දැඩි අවශ්‍යතාවක් පැවතීම

- තරගකාරී ව්‍යාපාරික ලෝකය තුළ රැඳී සිටීම සඳහා නවෝත්පාදන බිහි කිරීමේ අවශ්‍යතාව පැවතීම

- වෙනස් වන ලෝකයට නායකත්වය දිය හැක්කේ ව්‍යවසායකයින්ට බැවින් සෑම සංවිධානයකට ම ව්‍යවසායකයින් අවශ්‍ය වීම

- පුද්ගල අවශ්‍යතා හා වුවමනා උසස් මට්ටමින් තෘප්තිමත් කිරීම තුළින් ජීවන තත්වය උසස් කිරීම සඳහා නවෝත්පාදන බිහි කිරීමේ අවශ්‍යතාව පැවතීම

- දිනෙන් දින වෙනස් වන නව තාක්ෂණය හමුවේ ව්‍යාපාර කටයුතු දියුණු කර ගැනීමේ අවශ්‍යතාව

- නව ව්‍යාපාර ඇරඹීම හරහා රැකියා නිර්මාණය කළ හැකි වීම

ClassWork.LK

# ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර ඇති සම්බන්ධතාව

මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ.

මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා ඊට අනුබද්ධ කටයුතු ව්‍යාපාර ලෙස පුළුල් ව විග්‍රහ කළ හැකි ය.

මේ අනුව ව්‍යවසායකත්වය තුළින් ද, ව්‍යාපාර විසින් ද මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිපදවීම හා ඒ ආශ්‍රිත සේවාවල නිරත වේ. නමුත් ව්‍යාපාරවලට සාපේක්ෂව ව්‍යවසායකත්වය විසින් ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය යන කටයුතුවල ද නිරත වේ.

මේ අනුව සියලු ව්‍යවසාය ව්‍යාපාර වන අතර සියලු ව්‍යාපාර ව්‍යවසායන් නො වන බව ද පැහැදිලි වේ.

ClassWork.LK

එසේ ම ව්‍යවසායකත්වයේ අවසාන ප්‍රතිඵලය ව්‍යාපාර ලෙස හැඳින්විය හැකි ය.

## ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ

ව්‍යවසායකත්වය තුළින් පුද්ගල, ආයතනික, සමාජ හා ආර්ථික ප්‍රතිලාභ අත් වේ.

### පුද්ගල ප්‍රතිලාභ

- පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථා ලැබීම
- ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම
- සමාජ තත්වය හා පිළිගැනීම ඇති වීම
- ආත්ම තෘප්තිය ලැබීම
- පෞද්ගලික මූල්‍යමය ලාභ ලැබීම

ClassWork.LK

## ආයතනික ප්‍රතිලාභ

- තරඟකාරිත්වයට මුහුණ දීමට පහසු වීම

- ව්‍යාපාර කටයුතු පුළුල් වීම
- අඛණ්ඩ ව වර්ධනය වීම

- වෙළෙඳපොළ කොටස පුළුල් වීම

- කර්මාන්තය තුළ විශිෂ්ඨයින් බවට පත්වීම

## සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ

- නව රැකියා අවස්ථා උත්පාදනය වීම

- ආදායම් අවස්ථා බිහි වීම

- නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදා වීම

- ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම

ClassWork.LK

- ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම

- නව වෙළෙඳපොළවල් සංවර්ධනය වීම

# ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය

ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පහත දැක්වෙන කරුණු මගින් පැහැදිලි කළ හැකි ය.

- ව්‍යවසායකත්වය නිසා නව්‍යතා බිහි වීමෙන් ජාතික නිෂ්පාදිතය ඉහළ යාම

- නව රැකියා අවස්ථා බිහි වීමෙන් සේවා නියුක්ති මට්ටම ඉහළ යාම

- නව රැකියා සම්පාදනයෙන් ආර්ථික සංවර්ධනය වේගවත් වීම

නව රැකියා අවස්ථා → ආදායම් මට්ටම ඉහළ යාම → ක්‍රය ශක්තිය ඉහළ යාම

↑ නිෂ්පාදනය වැඩි වීම ← භාණ්ඩ ඉල්ලුම වැඩි වීම ←

ClassWork.LK

- වෙළෙඳපොළ කටයුතු පුළුල්වීමත්, නව තරඟකාරී වෙළෙඳපොළවල් බිහිවීමත් මඟින් ආර්ථික සංවර්ධනය ඉහළ යාම

- ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමෙන් ඒවාට ඉහළ ඉල්ලුමක් ඇති වීම

- නව ව්‍යාපාර බිහි වීම නිසා ආර්ථික සංවර්ධනය ඇති වීම

ClassWork.LK

# ව්‍යවසායකත්වයේ ප්‍රවණතා

- ගෝලීය ව්‍යවසායකත්වය
(Global Entrepreneurship)

- සමාජයීය ව්‍යවසායකත්වය
(Social Entrepreneurship)

- හරිත ව්‍යවසායකත්වය
(Green Entrepreneurship)

- අභ්‍යන්තර ව්‍යවසායකත්වය
(Intra Entrepreneurship)

ClassWork.LK

# ගෝලීය ව්‍යවසායකත්වය

ගෝලීය වශයෙන් වෙළෙඳාමේ යෙදීමයි. එනම්, ලෝකයේ කුමන ස්ථානයක සිටිය ද, තාක්ෂණය භාවිතයෙන් ලෝකයේ වෙනත් ඕනෑ ම රටක් හෝ ස්ථානයක් සමග සන්නිවේදනයේ යෙදී දේශ සීමා මායිම්වලින් බැහැර ව කටයුතු කිරීමේ හැකියාවයි. එක් ස්ථානයක සිට ලෝකය පුරා තමාගේ නිෂ්පාදන සාර්ථක ව බෙදා හැරීම සඳහා ඒ ඒ රටවල පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන එම අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට තම නිෂ්පාදිත ලබා දීම ගෝලීය වශයෙන් ව්‍යවසායකත්වයේ එල නෙලා ගැනීම යි.

මෙහි දී අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ ව දැන සිටීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් වේ. මේ සඳහා වෙනත් රටවල් සමග, ජාතීන් සමග හොඳ සම්බන්ධතා පවත්වා ගැනීම අවශ්‍ය වේ. ජාතීන් අතර, සංස්කෘතීන් අතර පවතින වෙනස්කම් හඳුනාගැනීම මඟින් අවස්ථා සම්පාදනය කර ගැනීම සිදු වේ.

ClassWork.LK

## සමාජීය ව්‍යවසායකත්වය

සමාජීය මෙහෙවරක් කිරීමේ චේතනාවෙන් සමාජීය ගැටලුවලට පිළියම් යෙදීමට නවෝත්පාදනයේ යෙදීම මින් අදහස් කෙරේ. මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රසංසාව, පරෝපකාරය යනා දී ප්‍රතිලාභ සමාජීය ව්‍යවසායකත්වය තුළින් අපේක්ෂා කෙරේ. සමාජීය ව්‍යවසායකයින්ගේ අරමුණ වන්නේ ලෝකය යහපත් ස්ථානයක් බවට පත් කිරීමයි.

## හරිත ව්‍යවසායකත්වය

හරිත ව්‍යවසායකත්වය යනු පාරිසරික හා සමාජීය ගැටලු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහළ අවදානමකින් යුතුව ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීමට ව්‍යාවසායකත්ව අදහස් මගින් දැනුවත් භාවයකින් යුතු ව කරනු ලබන ක්‍රියාකාරකම් ය.


හරිත ව්‍යවසායකයින් පරිසරය සුරැකීම ඔවුන් ගේ හර සංකල්පය ලෙස සලකයි. පරිසර ගැටලුවලට ඉතා සංවේදී අය වේ. මෙම ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර කටයුතුවලින් ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කරයි.

ClassWork.LK

# අභ්‍යන්තර ව්‍යවසායකත්වය

සංවිධානවල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයින් එම ආයතනවල නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රමවල වෙනස්කම් සිදු කරයි. ඉහළ කළමනාකරුවන් එම නිර්මාණශීලී කටයුතු කිරීම සඳහා එවැනි පුද්ගලයන් දිරිගන්වයි. මෙසේ සංවිධානයක වෙනස්කම් හඳුන්වා දෙන, ආයතනයක් තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායකත්වය අභ්‍යන්තර ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ.

ClassWork.LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
BUSINESS
STUDIES
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 11.00
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura